ගෙවුණු සතියේ නඩු

01) පොලිස් නිලධාරීන් පිරිසකට පහරදී මරණ තර්ජනය කිරීමේ චෝදනාවකට වරදකරු කරමින් සිර දඬුවම් නියම වූ සමගි ජන බලවේගයේ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා ඇප මත මුදා හරින ලෙස බදුල්ල මහාධිකරණය නියෝග කරයි.

මන්ත්‍රීවරයා විසින් දඬුවම වෙනුවෙන් සිය නීතිඥයන් මාර්ගයෙන් අභියාචනයකට යටත්ව බදුල්ල මහාධිකරණයට ඉදිරිපත් කර තිබූ ඇප අයැදුමක් ඊයේ (24) සලකා බැලීමෙන් අනතුරුව මෙලෙස ඇප මත මුදා හරින ලෙස නියෝග කළේ ය.

එහිදී චමින්ද විජේසිරි මහතා රුපියල් 50,000ක ඇප මුදලක් සහ රුපියල් ලක්ෂ 10 බැගින් ශරීර ඇප දෙකක් මත මුදා හැරීමට මහාධිකරණ විනිසුරුවරයා නියෝග කළේ ය.

02)ප්‍රබල පාතාල ක්‍රියාකාරිකයකු බව කියන සමන්ත කුමාර පෙරේරා හෙවත් අයි.ඩී.එච්.සුද්දාට එරෙහිව පවරා තිබූ නඩුවක් ඔක්තෝබර් 5 වැනිදා යළි කැඳවීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස් බෝදරගම ඊයේ(24) නියෝග කළා.

සිද්ධියට අදාල නඩුව කැඳවූ අවස්ථාවේ දී බූස්ස බන්ධනාගාරය විසින් සැකකරු අධිකරණයට ඉදිරිපත් කර තිබුණා.

නඩුව කැඳවූ අවස්ථාවේදි සැකකරු විසින් සාක්ෂි කූඩුවේදී සාක්ෂි ලබා දෙනු ලැබුවා.

4) සහරාන් හෂිම් ඇතුළු මුස්ලිම් ආගමික අන්තවාදීන් සමග එක්ව 2018 වසරේදී පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තේ නීති විරෝධී ආකාරයෙන් රැස්කළ ගිනි අවියක් ඇතුළු පුපුරන ද්‍රව්‍ය රැස් කර තැබීම ඇතුළු චෝදනා යටතේ අබූ හනීෂා මොහොමඩ් මුසීත් හෙවත් අබූ දහිදා ඇතුළු විත්තිකරුවන් හය දෙනෙකුට එරෙහිව නීතිපතිවරයා විසින් පවරා තිබූ නඩුවේ සාක්ෂි විභාගය ලබන සැප්තැම්බර් 18 වැනිදා දක්වා කල්තැබීමට විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය ඊයේ(24) නියෝග කළේ ය.

එම නඩුව ලාල් රණසිංහ බණ්ඩාර, රශ්මි සිංගප්පුලි හා චතුරිකා වික්‍රමසේකර යන ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල හමුවේදී ඊයේ කැඳවිණි.

5)පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහා-රය සම්බ-න්ධ-යෙන් නවු-ෆර් මවු-ලවි ඇතුළු විත්ති-ක-රුවෝ 24 දෙන-කුට එරෙ-හිව අධි චෝදනා 23,270ක් ගොනු කර විභාග වන පාස්කු මහ නඩුවේ තීන්දුවට දින නියම කරයි. ඒ අනුව නඩුවේ තීන්දුව සැප්තැම්බර් 22 නිකුත් කරන බව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල නිවේදනය කලේය.විත්තියේ සාක්ෂි විභාගය ඊයේ (24) සවස 6.00ට අවසන් කල අතර ලිඛිත දේශන සඳහා ලබන සැප්තැම්බර් 09 වැනිදා කැඳවීමට නියමිතයි.

5) මහින්දානන්ද අලුත්ගමගේට පනවා ඇති නඩුවක් දෙසැම්බර් 4 යළි කැඳවයි

ප්‍රමිතියෙන් තොර කාබනික පොහොර නැවක් ඊයේ රජය සමයේ මෙරටට ආනයනය කිරීමේ සිද්ධියකට අදාලව හිටපු කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ ඇතුලු සැකකරුවන් දෙදෙනෙකුට එරෙහිව අල්ලස් කොමිසම ගොනු කර තිබෙන නඩුව දෙසැම්බර් 4 යළි කැඳවීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්. බෝදරගම ඊයේ (25) දින නියම කළා.

අල්ලස් කොමිසම වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටි නිලධාරීන් වැඩිදුර වර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරමින් කරන ලද කරුණු සලකා බැලීමෙන් අනතුරුව මෙලෙස නියෝග කළා.

6) සජින් වාස්ට එරෙහි නඩුව නොවැම්බර් 27 වැනිදා යළි කැඳවයි

රුපියල් මිලියන 243.8ක නීතිවිරෝධී වත්කම් ඉපැයීමේ චෝදනාවක් අල්ලස් කොමිසම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සජින් වාස් ගුණවර්ධනට එරෙහිව පනවා ඇති නඩුව නොවැම්බර් 27 වැනිදා යළි කැඳවන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්.බෝදරගම ඉකුත් (25) නියෝග කළා.

සිද්ධියට අදාලව නිලධාරීන් විසින් අධිකරණයට කරන ලද කරුණු දැක්වීමෙන් අනතුරුව මෙලෙස නියෝග කරනු ලැබුවා.

7) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවාගෙන ප්‍රශ්න කරනු ලැබූ කෝරලගමගේ මන්දිනු පත්මසිරි පෙරේරා නොහොත් කෙහෙල්බද්දර පද්මේ ලබන 3 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්.බෝදරගම ඉකුත් (25) නියෝග කළා.

සිද්ධියට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද කරුණු දැක්වීමෙන් අනතුරුව මෙලෙස නියෝග කරනු ලැබුවා.

සිද්ධියට අදාල සැකකරු දැඩි ආරක්ෂාව යටතේ අධිකරණයට ගෙන එනු ලැබුවා.

8) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවාගෙන ප්‍රශ්න කරනු ලැබූ පානදුර නිලංග නමැත්තා ලබන 3 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්.බෝදරගම ඉකුත්(25) නියෝග කළා.

සිද්ධියට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද කරුණු දැක්වීමෙන් අනතුරුව මෙලෙස නියෝග කරනු ලැබුවා.

සිද්ධියට අදාල සැකකරු දැඩි ආරක්ෂාව යටතේ අධිකරණයට ගෙන එනු ලැබුවා.

සිද්ධියට සම්බන්ධයෙන් අධිකරණයට කරුණු දක්වමින් විමර්ශන නිලධාරීන් පවසා සිටියේ මෙම සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අවි ආයුධ සන්තකයේ තබා ගැනීම යටතේ සැකකරුට එරෙහිව චෝදනා ගොනු කර ඇති බවයි.

9) හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ හිටපු පෞද්ගලික ලේකම්, සුගීෂ්වර බණ්ඩාර මහතා සැප්තැම්බර් 09 වැනිදා දක්වා යළි රක්ෂිත බන්ධනාගාරගත කර තිබේ.

ඒ ඉකුත්(25) අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

10)ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවාගෙන ප්‍රශ්න කරනු ලැබූ කෝරලගමගේ මන්දිනු පත්මසිරි පෙරේරා නොහොත් කෙහෙල්බද්දර පද්මේගේ ජංගම දුරකථනයේ තිබී බන්ධනාගාර නිලධාරීන් 13 දෙනකුගේ දුරකථන අංක සහ නිරූපණ ශිල්පින් 7 ඇතුලු දේශපාලනඥයන් 9 දෙනෙකුගේ ඡායාරූප සොයා ගැනීමට හැකි වූ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉකුත් (25) කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්.බෝදරගම හමුවේ දැන්වූවා.

ඒ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවාගෙන ප්‍රශ්න කරනු ලැබූ

කෙහෙල්බද්දර පද්මේ නමැත්තා අද දින අධිකරණයට ඉදිරිපත් කරමිනි.

11) පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාර සිද්ධිය සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනවලට අදාළව තමන්ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවාගැනීම අභියෝගයට ලක් කරමින් රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ සුරේෂ් සලේ විසින් ඉදිරිපත් කළ පෙත්සමට අදාළව ගොනුකර තිබෙන

අතරමැදි පෙත්සම් විභාග කිරීම සඳහා නොතිසි නිකුත් කරනවාද නැද්ද ගැන නියෝගය ඔක්තෝම්බර් මස 7 වැනිදා ප්‍රකාශයට පත් කරන බව අභියාචනාධිකරණය නිවේදනය කරයි.

එම අතරමැදි පෙත්සම් ඊයේ (25) සලකා බැලීමෙන් අනතුරුව අභියාචනාධිකරණය විසින් මෙම නියෝගය නිකුත් කළේය.

පූජ්‍ය බෙන්ගම්බුවේ නාලක හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා සහ කාදිනල් අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් ඇතුළු පාර්ශ්ව දොළහක් විසින් මෙම අතරමැදි පෙත්සම් ඉදිරිපත් කර ඇත.

18) පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයට අනුග්‍රහය දක්වමින් කුමන්ත්‍රණකාරී ලෙස කටයුතු කර ඇතැයි විමර්ශනවලට ලක්ව සිටින රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ සුරේෂ් සලේ මහතා තවත් දින 90ක කාලයක් රඳවා ප්‍රශ්න කිරීමට නියෝග කර තිබේ.

එහිදී ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපති අනුර කුමාර දිසානායක සැලකිල්ලට ගෙන ඇති ප්‍රධාන කාරණයක් වන්නේ සුරේෂ් සලේ මහතා රැඳවුම් නියෝග භාරයේ සිටි දින 90න් 78ක්ම රෝහල්ගතව සිටීමය.

20)පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන විමර්ශනවලට අදාළව රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ සුරේෂ් සලේ අත්අඩංගුවට ගනු ලැබුවේ, සාධාරණ සැකයක් උද්ගත වීමෙන් පසුව බවත්, මෙම විමර්ශනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ශානි අබේසේකර ද්වේශසහගත ආකාරයෙන් කටයුතු කළ බවට එල්ල කරන චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන බවත් නීතිපතිවරයා ඊයේ(අගෝ: 25) අභියාචනාධිකරණය හමුවේ ප්‍රකාශ කළේ ය.

21) දූෂණ චෝදනාවත් සම්බන්ධයෙන් අල්ලස් කොමිසම විසින් අත්අඩංගුවට ගෙන ඇප මත මුදාහැර සිටින හිටපු විදේශ රැකියා ඇමැති මනූෂ නානායක්කාරට එරෙහිව පවරා ඇති නඩුවේ මූලික විමර්ශන කටයුතු අවසන් බව අල්ලස් කොමිසම ඊනුත් (28) කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස්. බෝදරගම හමුවේ දන්වා සිටියා.

සිද්ධියට අදාල නඩුව කැඳවූ අවස්ථාවේදී අල්ලස් කොමිසම පවසා සිටියේ සිද්ධියට අදාලව මූලික විමර්ශන කටයුතු අවසන් බැවින් නෛතික ක්‍රියාමාර්ග දැනුම් දීමට දිනයක් ලබා දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියා.

ඒ අනුව වැඩිදුර වාර්තා ඉදිරිපත් කිරීමට මහේස්ත්‍රාත්වරයා දෙසැම්බර් 18 වන දින නියම කළා.

සිද්ධියට අදාළ සැකකරු විවෘත අධිකරණයේ පෙනී සිටියා.

පසුගිය රජය සමයේ කෘෂිකාර්මික රැකියා සඳහා ඊශ්‍රායලයට සේවකයන් යැවීමේදී ඇමැති ධූරය අවභාවිත කරමින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ට බලපෑම් කළ බව කියන සිද්ධියට අදාලව අල්ලස් කොමිසම විසින් අත්අඩංගුවට ගෙන මෙම සැකකරු මේ වන විට ඇප මත මුදාහැර තිබෙනවා.

22) දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් ඇප මත මුදා හැර සිටින හිටපු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය හා විශේෂ ව්‍යාපෘති අමාත්‍ය ලෙස කටයුතු කළ එස්.එම්. චන්ද්‍රසේනට මහාධිකරණයේ අධි චෝදනා ගොනු කළ බව අල්ලස් කොමිසම ඊයේ (28) කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අසංග එස්.බෝදරගම හමුවේ දන්වා සිටියා.

සිද්ධියට අදාල නඩුව කැඳවූ අවස්ථාවේදි අල්ලස් කොමිසම විසින් මෙලෙස දන්වා සිටියා.

වැඩිදුරටත් අධිකරණයට කරුණු දැක්වූ අල්ලස් කොමිස පවසා සිටියේ මෙම සැකකරුට එරෙහිව මේ වනවිට මහාධිකරණයේ අධි චෝදනා ගොනු කර ඇති බැවින් මෙම අධිකරණයේ නඩු කටයුතු අවසන් කරන බවයි.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා නියමිත දින මහාධිකරණයේ පෙනී සිටින ලෙස සැකකරුට නියෝග කළා.

සැකකරු ඉකුත් (28) විවෘත අධිකරණයේ පෙනී සිටියා.

2014 වර්ෂයේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිළිඳු ගොවීන්ට සහනදායි මිලට ලබා දීම සඳහා රජයේ රු. මිලියන 25 ක වියදමින් ගෙන්වන ලද බීජ බඩ ඉරිඟු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන්ට බලපෑම් කරමින් 2015 ජනාධිපතිවරණයට වාසි ලබා ගැනීමේ අරමුණින් තම දේශපාලන හිතවතුන් මඟින් බෙදා දීම තුළින් රජයට පාඩුවක් සිදු කිරීමේ චෝදනාව මත සැකකරාර හිටපු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය හා විශේෂ ව්‍යාපෘති අමාත්‍ය ලෙස කටයුතු කළ එස්.එම්. චන්ද්‍රසේන මහතා පසුගිය ජූලි 4 වැනිදා අල්ලස් කොමිසම විසික් අත්අඩංගුවට ගෙන ඇප මත මුදා හැර තිබුණා.

23)ගණේමුල්ල සංජිව ඝාතනය කිරීමේ සිද්ධියට අදාලව සිදු කරනු ලබන විමර්ශනවලට රක්ෂිත අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාරගත කර සිටින ඉෂාරා සෙව්වන්දී නමැත්තියගෙන් ප්‍රකාශ ලබා ගැනීමට තිබෙන බැවින් ඒ සඳහා අවසර ලබා දෙන ලෙස කොළඹ අපරාධ කොට්ඨාශය ඉකුත්(28) කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අසංග එස් .බෝදරගම හමුවේ දන්වා සිටියා.

සිද්ධියට අදාලව මෝෂමක් ගොනුකරමින් කොළඹ අපරාධ කොට්ඨාශය මේ බව අධිකරණයට දන්වා සිටියා.

සිද්ධිය සම්බන්ධය වැඩිදුරටත් අධිකරණයට කරුණු දක්වමින් විමර්ශන නිලධාරීන් සඳහන් කර සිටියේ ගණේමුල්ල සංජීව ඝාතනය කිරීමේ සිද්ධියට අදාළව සිදු කරනු ලබන විමර්ශන සඳහා මෙම සැකකාරියගෙන් ප්‍රකාශ ලබා ගැනීමට තිබෙන බවයි.

ලබන 2 දින අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයට ගොස් ප්‍රකාශයක් ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙසයි කොළඹ අපරාධ කොට්ඨාශය වැඩිදුරටත් අධිකරණයෙන් ඉල්ලා සිටියේ.

ඒ සඳහා බන්ධනාගාර අධිකාරිවරයා දැනුවත් කරන ලෙසද කොළඹ අපරාධ කොට්ඨාශය අධිකරණයෙන් ඉල්ලා සිටියා.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා එම ඉල්ලීමට අදාල නියෝගය නිකුත් කළා.

24)

මීගමුව බන්ධනාගාර ගැටුමෙන් 32 දෙදෙනෙක් මියයාම සම්බන්ධයෙන් මීගමුව අධිකරණයේ සැකකරුවන් හඳුනා ගැනීමේ පෙරට්ටුව සඳහා ලබන සැප්තැම්බර් 8 වැනිදා මීගමුව අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස මීගමුව ප්‍රධාන ජේලර් , ඇතුළු බන්ධනාගාර නිලධාරීන් ඇතුළු 20කට නොතිසි නිකුත් කරන මීගමුව ප්‍රධාන මහෙස්ත්‍රාත් ශිලනි පෙරේරා මහත්මිය නියෝග කරයි.

මීගමුව බන්ධනාගාරයේ ඇතිවූ ගැටුම්කාරී තත්ත්වය සම්බන්ධ වූ නඩුකරය ඉකුත් (28) යළිත් මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී කැඳවනු ලැබුවා.

එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය නඩුවාරයේදී සැකකරුවන් 70 නම් කර තිබූ අතර අද දින සැකකරු අංක 1 සිට 6 දක්වා හඳුනා ගැනීමේ පෙරට්ටුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණා.

25)සමාජ මාධ්‍ය ඔස්සේ අවුරුදු 2ක සිට මුහුණු පොත හරහා ගිණුමක් සාදා දරුවන්ගේ සහ කාන්තාවන්ගේ අසභ්‍ය ඡායාරූප විකුණූ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් තරුණයෙකු ලක්ෂ 10 බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදා හැරීමට කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ඕෂද මිගාර මහාරච්චි ඉකුත් (28) නියෝග කළා.

ළමා හා කාන්තා කාර්යාංශය විසින් අධිකරණයට කරන ලද කරුණු දැක්වීමෙන් අනතුරුව මෙලෙස නියෝග කරනු ලැබුවා.

වයස අවුරුදු විසි දෙකක් වයසැති තරුණයකු මෙසේ ඇප මත මුදා හරිනු ලැබුවා.

සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුරටත් අධිකරණයට කරුණු දක්වමින් ළමා කාන්තා කාර්යාංශය ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිමාලි ශරෝමාලි ඇතුලු නිලධාරීන් පවසා සිටියේ මෙම සැකකාර තරුණයා විසින් අවුරුදු දෙකක් තිස්සේ සමාජ මාධ්‍ය භාවිතා කරමින් මෙලෙස කාන්තාවන්ගේ සහ දරුවන්ගේ අසභ්‍ය ඡායාරූප සමාජ මාධ්‍ය ඔස්සේ විකුණා මුදල් උපයා ඇති බවයි.

මෙම සමාජ මාධ්‍ය ගිණුමේ මේ වන විට 8000කට අධික පිරිසක් දක්නට ලැබෙන බවයි ළමා හා කාන්තා කාර්යාංශය දන්වා සිටියේ.